


# සරුංගලය

T.M.K. සිතුමිණි බණ්ඩාර

5 - D

කතෘගේ නම - T.M.K. සිතුමිණී බණ්ඩාර (5 – D)

කතෘගේ වෙනත් කෘති

- පොකුණේ ආගන්තුකයා
- ලෝකාන්ත චාරිකාව

කෘතිය පල කරන දිනය - 2025 පෙබරවාරි 08

ISBN අංකය - 978-624-208-355-1

පිදුම

ආදරණීය

මහාමායා

මාතාවට

සෙනෙහසින් !

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ජේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,


ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

දැන් පාසල් නිවාඩු කාලයයි. නඳුන් අයියයි මමයි හැදුවා ලස්සන මොණර සරුංගලයක්.



ඉතිං සරුංගලය යවන්න අපි දෙන්නා ගියා අපේ වෙලට. ගමේ අයියලා, මාමලා පිරිලා. එක එක මෝස්තර වල පාට පාට සරුංගල්. නයා සරුංගල්, මොණර සරුංගල්, වවුල් සරුංගල් තව මාළු සරුංගලුත් තියෙනවාලු.



මමත් අයියාට උදවු කළා සරුංගලය යවන්න. අපි සරුංගලය යවන ගමන් ඉන්න විට අනේ එක පාරටම වෙන සරුංගලයක නූලක් අපේ සරුංගලයේ නූලේ පැටලුනා. අපේ සරුංගලය උඩ පාවෙන්නේ නෑ. මම කෑ ගැහුවා.



අපේ අයියා කොහොම හරි පැටලුම ගලවාගත්තා. දැන් අපේ සරුංගලය උඩටම පාවෙලා යනවා.



එක පාරටම ලොකු හුළඟක් ආවා. අනේ අපේ සරුංගලයේ නූල කැඩුණා. සරුංගලය හුළඟත් එක්ක අපි හැමෝම බලාන ඉන්න ගමන් ඈතට ඈතට පාවෙලා ගියා. අපි දෙන්නාට හරිම දුකයි.



පහුවදාත් අපි දෙන්නා එකතු වෙලා තවත් සරුංගලයක් හැදුවා. ඒක අලවලා දිග රැළි දැම්මා. නයා සරුංගලයක්. සරුංගලය යවන්න අපි අපේ වෙළට ගියා. ඒක නම් ටිකක් බරයි වාගේ.



අපි දෙන්නා සරුංගලය යවන්න සූදානම් වෙන විටම සරුංගලය ඇළට වැටුණා. සරුංගලය ඔක්කොම තෙමුණා. පට්ටම විතරයි ඉතිරි වුණේ. නයා සරුංගලය දිග වැඩියි. ඒ හින්දා අපට අමාරුයි යවන්න.



ඊට පස්සේ අයියා වවුල් සරුංගලයක් හැදුවා. ඒකට එච්චර කොළ ගියෙත් නෑ. අපි දෙන්නාට වෙළට ගිහින් යවන්නත් පහසුයි. ඇළට වැටුණෙත් නෑ. ඒ සරුංගලය උඩටම ගියා.



සරුංගලය උඩටම යන විට නූල හරි තදට අපේ අතට දැනෙනවා.අපිත් උඩටම යන්න වාගේ දැනෙනවා. එහෙම වෙන්නේ උඩු සුළං වැඩි හින්දා කියලා  අයියා කීවා. නූල අපේ කනේ තිබ්බාම සුළගේ ශබ්දය අපට දැනෙනවා. සරුංගලය හරි සැහැල්ලුවෙන් උඩ පාවෙනවා.



එදා නම් අපි දෙන්නාට හරි සතුටුයි.



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්